D136

# ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල්වල ඵලදායීතාව කෙරෙහි බලපාන සාධක පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

ඒ. එම් හෙට්ටිගේ

අධ්‍යාපනවේදී ගෞරව, II පන්තිය, කොළඹ විශ්ව විද්‍යාලය, 1977.

අධ්‍යාපනපති (අධ්‍යාපන කළමනාකරණය) කොළඹ විශ්ව විද්‍යාලය, 1992.

අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව, විශිෂ්ට සාමාර්ථය, ජා.අ.ආ. 1993.

අධ්‍යාපන දර්ශනපති, කොළඹ විශ්ව විද්‍යාලය, 1998.

UCLIB
544772

අධ්‍යාපනශූරී උපාධිය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයට
ඉදිරිපත් කරන නිබන්ධනය - 2008.

# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ සමස්ත පාසල් අධ්‍යාපනය සඳහා පොදු ප්‍රතිපත්තියක්, අරමුණු, විෂයමාලා, පෙළපොත් ඇගයීම් හා විභාග ක්‍රම භාවිත වුවද එකිනෙක පාසල තුළ දෙනු ලබන අධ්‍යාපනයෙහි ගුණාත්මක බව හා ඵලදායිතාව අතින් පැහැදිලි විවිධත්වයක් පවතින බව පොදුවේ පිළිගනු ලබන්නකි. මෙම විවිධත්වයට හේතුව පාසලක ඵලදායිතාව සඳහා විවිධ සාධක බලපානු ලැබීමයි. ඒ සඳහා සෑම පාසලකටම සුවිශේෂී වූ මෙහෙවරක් හා එය සාක්ෂාත් කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ද තිබිය යුතුය. එම මෙහෙවර හා වැඩ පිළිවෙල පාසල් පාර්ශවකරුවන් දැන සිටිය යුතු අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා අප්‍රතිහත ධෛර්යකින් හා කැපවීමකින් එක්සත්ව කටයුතු කළ යුතුය. පාසල් පාර්ශවකරුවන් ඒ සඳහා මෙහෙයවීමට සුවිශේෂී දර්ශනයකින් හා විශිෂ්ට පෞරුෂ ගුණාංගවලින් යුත් උපදේශන නායකත්වයක් ද අවශ්‍ය වේ.

ඵලදායි පාසල පිළිබඳ විවිධ රටවල කරන ලද පර්යේෂණ අනාවරණයන්ට අනුව ඵලදායිතාව පිළිබඳ නිශ්චිත නිර්වචන හෝ සංඛ්‍යාමය දත්ත හෝ ඉදිරිපත් කළ නොහැකිය. කෙසේ වුවද එවැනි පර්යේෂණ මගින් යම්කිසි රටක, ප්‍රදේශයක පිහිටි පාසල්වල ඵලදායිතාව තීරණය කරන සාධක නිර්ණායක ආදිය පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකිය. එම පර්යේෂණ අනාවරණ මගින් ලබාගත් ප්‍රතිවේදය භාවිතයට ගනිමින් පර්යේෂකයාට තම පර්යේෂණය මෙහෙයවීම සඳහා අවශ්‍ය ඵලදායී පාසල පිළිබඳ සංකල්පීය රාමුව සකස් කරගත හැකි විය.

ජ්‍යෙෂ්ඨ ද්විතියක පාසල්වල ඵලදායිතාව කෙරේ බලපානු ලබන සාධක විමසා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන පරමාර්ථය විය. එම පරමාර්ථයට අයත් අරමුණු ඉටුකර ගැනීම සඳහා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ නියදි සමීක්ෂණ හා ප්‍රත්‍යයක අධ්‍යයන ප්‍රවේශ භාවිතා කෙරිණ. දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලී නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා හා වාර්තා විශ්ලේෂණ වැනි ක්‍රම ශිල්ප ද දත්ත විශේලේෂණය සඳහා සංඛ්‍යානම ක්‍රම ද යොදා ගැනිණ. ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයන් අනුගමනය කිරීම සඳහා මෙම පර්යේෂණය අදියර දෙකක් යටතේ සිදුවිය. පළමු අදියරේදී පර්යේෂණ අරමුණු යටතේ ප්‍රමාණාත්මක තොරතුරු ද, දෙවන අදියරේදී සුවිශේෂීව හඳුනාගත් පාසල් හයක් ප්‍රත්‍යයක අධ්‍යයනයට යොමු කරමින් ගුණාත්මක තොරතුරු ද එක්රැස් කෙරිණ. පළමු අදියර සඳහා

කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම අධ්‍යාපන කලාපවලට අයත් ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් නියෝජනයවන පරිදි ස්ථරගත අහඹුක්‍රමයට තෝරාගත් පාසල් 36 ක හා එහි පාර්ශකරුවන් 500 කින් අදාල දත්ත හා තොරතුරු ලබා ගැනිණ. ලබාගත් දත්ත හා තොරතුරු පර්යේෂණ අරමුණු යටතේ ඉදිරිපත් කරමින් විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලදි.

මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු පහකින් සමන්විතය. ඉන් පළමු අරමුණ යටතේ පර්යේෂකයා විසින් අදාල සාහිත්‍ය විමර්ශනය කරමින් සකසා ගත් සංකල්පීය රාමුවට අනුව නියදියට අයත් පාසල්වල ඵලදායිතාව තක්සේරු කිරීමට සුදුසු සාධක 12 ක් හා නිර්ණායක 95 කින් යුත් ප්‍රශ්නාවලියක් ද නිරීක්ෂණ නියමාවලියක් ද සකස් කරන ලදි. දෙවන අරමුණ යටතේ නියදියට අයත් පාසල් නිරීක්ෂණය කිරීමෙන් ද පාසල් පාර්ශවකරුවන්ට ප්‍රශ්නාවලි ලබා දීමෙන් ද එම පාසල්වල ඵලදායිතා සාධක ක්‍රියාත්මක මට්ටම තක්සේරු කරන ලදි. ඒ අනුව පිළිවෙලින් විදුහල්පති නායකත්වය, පාසලේ මෙහෙවර හා අරමුණු, පාසල් සංස්කෘතිය හා වාතාවරණය, විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රීය බව හා ගුරු කැපවීම යන සාධක නියැදියට අයත් පාසල්වල ක්‍රියාත්මක මට්ටම සතුටුදායක විය. එහෙත් පාසල හා ප්‍රජා සබඳතා, ගුරු - සිසු සංවර්ධන හා සුභසාධන කටයුතු, සිසු අපේක්ෂා ඉහළවීම විෂය සමගාමී කටයුතුවල ප්‍රමාණය සහ සහභාගිත්වය, මානව හා භෞතික සම්පත්වල ප්‍රමාණවත් බව යන සාධක ක්‍රියාත්මක වූ මට්ටම සතුටුදායක නොවීය. ශ්‍රී ලංකාවේ ඕනෑම පාසලක් ඵලදායිවීම සඳහා ඉවහල්විය හැකි ප්‍රධාන සාධක 7 ලෙස පිළිවෙලින් පාසලේ මෙහෙවර හා අරමුණු, පාසල් සංස්කෘතිය, විදුහල්පති නායකත්වය, ගුරු කැපවීම, සිසු අපේක්ෂා, විෂය මාලාව ශිෂ්‍ය කේන්ද්‍රීයබව, සම්පත්වල ප්‍රමාණවත් බව පාසල් හා ප්‍රජා සබඳතා යනුවෙන් එහි පාර්ශවකරුවන් විසින් නිගමනය කර තිබිණ.

තුන්වන අරමුණ යටතේ ඵලදායි සාධක හා එම පාසල්වල විභාග ප්‍රතිඵල අතර සහසම්බන්ධයක් තිබේ ද යන්න විමසා බැලිණ. ඵලදායි පාසල් සාධක හා ජාතික මට්ටමේ විභාග ප්‍රතිඵල සමඟ වැඩිම සහසම්බන්ධය අ.පො.ස. සා.පෙළ සමඟද අවම සම්බන්ධය 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව ප්‍රතිඵල සමඟද වාර්තාකර තිබිණ.

හතරවන අරමුණ යටතේ පර්යේෂකයා විසින් සකස් කරන ලද ඵලදායි පාසල් දර්ශකයට ලැබූ ලකුණු අනුව නියදියට අයත් පාසල් ඵලදායිතාවේ ඉතා ම ඉහළ සිට පහළ පාසල් දක්වා තරා කිරීමක් සිදුකර, කාණ්ඩ තුනකට වර්ග කරන ලදි. එම කාණ්ඩගත කිරීමට අනුව පාසල අයත් කලාපය, වර්ගය, පාලනය, සංයුතිය හා පිහිටීම අනුව පාසල්වල දැකිය හැකි විෂමතා අනාවරණය කරගත හැකි විය. පාසල අයත් කලාපය අනුව

එලදායිතාවේ ඉහළ ම හා පහළ ම යන දෙවර්ගයේ පාසල් වැඩි වශයෙන් කොළඹ ද අඩුම වශයෙන් හෝමාගම ද පිහිටා තිබිණ. ඒ අනුව එකම කලාපය තුළ පිහිටි පාසල් අතර එලදායිතා සම්බන්ධයෙන් වැඩිම විෂමතා කොළඹ හා අඩුම විෂමතා හෝමාගම කලාපයේ ද දක්නට ලැබෙන බව අනාවරණය විය. පාසල් වර්ගය අනුව තරාවේ 1 - 10 දක්වා ඉහළ එලදායි පාසල් 10 න් 9 ක්ම 1AB පාසල් විය. ඒ අනුව 1C පාසල්වලට වඩා 1 AB පාසල් එලදායි බව අනාවරණය විය. එසේ වුවද 1 AB පාසල් අතර පළාත් සභා පාසල්වලට වඩා ජාතික පාසල් ද ඊටත් වඩා පෞද්ගලික පාසල් ද එලදායිතාවෙන් ඉහළ විය. මේ අනුව රජයේ පාසල් අතර ජාතික පාසල් ද එම පාසල්වලට වඩා පෞද්ගලික පාසල් ද එලදායිතාවෙන් ඉහළ විය. රජයේ පාසල් අතර ජාතික හා පළාත් සභා පාසල් වශයෙන් එලදායිතාව පිළිබඳ විෂමතා දක්නට ලැබිණ. සංයුතිය අනුව මිශ්‍ර පාසල්වලට වඩා පිරිමි පාසල් ද පිරිමි පාසල්වලට වඩා ගැහැණු පාසල් ද එලදායිතාවෙන් ඉහළ විය. මිශ්‍ර පාසල්වල 1AB හා 1C වශයෙන් ගැහැණු හා පිරිමි පාසල්වලට වඩා විෂමතා දක්නට ලැබිණ. පිහිටීම අනුව මහ නගර සභා පාසල් අතර එලදායිතාව සම්බන්ධයෙන් වැඩිම විෂමතා තිබුණි. අනෙකුත් පාලන ඒකකවලට සාපේක්ෂව මහ නගර සභාවල පිහිටි ඉහළ ම හා පහළ ම එලදායි පාසල් සංඛ්‍යාව ද ඉහළ විය.

**පර්යේෂණයේ දෙවන අදියර** යටතේ ඉතා ම ඉහළ හා ඉතා ම පහළ ම වශයෙන් තරා වූ පාසල් තුන බැගින් පාසල් හයක් ප්‍රත්‍යයක අධ්‍යයනයට ලක් කරන ලදි. මෙහිදී එම පාසල් පිළිබඳ පළමු අදියරේදී දත්ත විශ්ලේෂණයෙන් ලබාගත් තොරතුරුවලට අමතරව සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා වාර්තා විශ්ලේෂණ මගින් ප්‍රත්‍යයක අධ්‍යයන ප්‍රවේශය යටතේ ගැඹුරින් තොරතුරු විමසා බැලිණ. එහිදී එම පාසල් අතර එලදායිතාව සම්බන්ධයෙන් පැහැදිලි විෂමතා පැවති අතර එයට ඉවහල් වූ පසුබිම් තොරතුරුද අනාවරණය කරගත හැකි විය. එම තොරතුරු මගින් පළමු අදියරේ හතරවන අරමුණ යටතේ පාසල් එලදායිතාව සම්බන්ධයෙන් විෂමතා ඇති වීමට හේතු ලෙස අනාවරණය වූ තොරතුරු තව දුරටත් තහවුරු කරගත හැකිවිය. එමෙන්ම පාසල් එලදායිතාව මැනීමට යොදා ගත් දර්ශකයේ වලංගුතාව තහවුරු කර ගැනිමට ද හැකි විය. ඒ අනුව මෙම පර්යේෂණ අනාවරණ ඇසුරින් එළඹුණු නිගමනයන් මෙම පාසල් නියැදියට සමාන ශ්‍රී ලංකාවේ පිහිටි ඕනෑම පාසලක් සම්බන්ධයෙන් සාමාන්‍යකරණය කිරීමට බාධාවක් නොවනු ඇත. පර්යේෂකයා විසින් තම නියැදියට අයත් පාසල් තරා කිරීමට යොදාගත් එලදායි පාසල් දර්ශකය තව දුරටත් සංවර්ධනය කරමින් **පස්වන අරමුණ** යටතේ ඉදිරිපත් කරන ලදි. එමෙන්ම ඉදිරි පර්යේෂණ සඳහා එම දර්ශකය ප්‍රයෝජනයට ගැනීමට හෝ තවදුරටත් සංවර්ධනය කිරීමට හෝ ඉඩ ප්‍රස්තා ඇති බව ද පර්යේෂකයා විසින් යෝජනා කරනු ලැබ ඇත.



Library

# Abstract

It is widely accepted that, in spite of the availability of a national policy, common educational objectives, curricular, text books, evaluation and examination systems to guide the general education process in Sri Lanka, there are clear inequalities within the system in terms of quality and effectiveness. The main reason for this diversity is that there are various factors affecting school effectiveness. There is a need for a mission for each school and a systematic plan to achieve it. Both mission and the plan should be known to all the stakeholders concerned. Moreover, all stakeholders should work together with dedication to implement the plan. There should also be an instructional leader in the school with a vision and positive personality traits capable of directing the stakeholders towards that goal.

It is difficult to provide a precise definition of, or statistical data, on school effectiveness based on the findings of studies done in different countries on the subject. Yet, it is possible to identify factors that determine effectiveness of schools in a particular country or area. It is possible for a researcher, based on the insights derived from such studies, to develop a conceptual framework to guide his or her research.

The main objective of the present study has been to examine the factors that affect effectiveness of senior secondary schools. In order to achieve this objective, an exploratory research design involving sample surveys and case studies has been employed. While questionnaires, observations, interviews and documentary analysis have been used as techniques of data collection, statistical methods were used for data analysis. The study was conducted in two stages in order to facilitate the use of both quantitative and qualitative approaches. Quantitative data was collected in stage one, while, in stage two, case studies of six schools were undertaken in order to collect qualitative data. In the first stage of the study, 36 schools were drawn on the basis of a stratified random sample representing senior secondary schools in all educational divisions in the Colombo district. Then a sample of

500 stakeholders was drawn from these schools. The data collected from these respondents has been analyzed and interpreted in keeping with the objectives of the study.

The study has had five key objectives. Firstly, the researcher, based on the conceptual framework developed on the basis of the literature survey, formulated a questionnaire covering twelve factors and 95 criteria suitable to measure school effectiveness. Pursuing the second objective, based on observation and questionnaires administered among stake-holders, the extent of the presence of school effectiveness factors has been estimated. It was found that principal's leadership, school mission and objectives, school culture and environment, curricular, student centeredness, and teachers' commitment were satisfactory in the sample schools. Yet, the situation with regard to school- community relations, student- teacher welfare, extent of extra- curricular activities and student expectations in them and physical resources was not satisfactory. The factors that contribute to school effectiveness in the country as identified by stakeholders in descending order of importance are; school mission and objectives, school culture, principal's leadership, teacher commitment, student expectations, student- centeredness of the curriculum, adequacy of resources and community relations.

In line with the third objective, it was investigated whether there is a correlation between factors of effectiveness on one hand and examination results in schools on the other. In the above regard, a clear relationship was found between factors of school effectiveness and GCE Ordinary Level results. The weakest relationship was found between factors of school effectiveness and Grade Five scholarship examination results.

The fourth objective of the study was to develop a school effectiveness index and use it to rank schools in terms of school effectiveness. Accordingly, schools were divided into three levels ranging from highest to the lowest level of effectiveness.

The above classification helped explain disparities among schools in terms of zone, school category, type of administration, composition and location. Accordingly, greatest disparities were found in the Colombo division, while the least disparities were found in

Homagama division. As regards the type of schools, 9 out of 10 highest ranking schools belonged to IAB category. In other words, IAB schools were more effective than IC schools. However, among IAB schools, national schools were higher in the rank than Provincial schools and private schools were higher in rank in comparison to both national and provincial schools. Accordingly, among government schools national schools ranked higher than provincial schools and private schools ranked higher than government schools. As for student composition, male schools ranked higher than mixed schools. Yet, female schools ranked higher than male schools. When mixed schools are taken together, there are still disparities between IAB and IC schools, the former ranking higher. As for the location, disparities were greater among schools in Municipal areas than elsewhere.

In the second stage of the study, six schools, (three highest and three lower ranking schools) were selected for case studies. These schools were subjected to in- depth study using interviews, direct and indirect observation and documentary analysis. The data thus collected pointed to significant disparities among these schools and the factors that contributed to such disparities. In- depth analysis carried out confirmed the earlier findings as regards the factors determining school effectiveness. Moreover, in-depth data also confirmed the validity of the school effectiveness index developed on the basis of quantitative survey. Accordingly, the conclusions derived from the study may well be generalized with respect to schools in other parts of Sri Lanka. In pursuance of the fifth objective of the study, school effectiveness index used for ranking schools has been further improved and presented. Finally, the research points out that there is room for improving the above index further and future use.